# හද රිදවන මතක සුවඳ සහ අන්ධ භක්තිය – 3

ශ්‍රීමතී සහෝදරියගේ කතාව අවසන් කරන්නට පෙර තවත් කරුණක් පැවසිය යුතුව තිබේ. ගැහැණු අය ගැන විශ්වයීය ආකාරයක් සහිත දේශපාලන විග්‍රහයක යෙදෙන්නට ද රෝහිත සහෝදරයා උත්සාහ කර ඇත. .චිත්‍රාංගනී ප්‍රනාන්දු නම් වූ එම සොහොයුරිය ජවිපෙ නායකයාගේ බිරිඳ මිස, ජනතා විමුක්ති පෙරමුණේ ගමන් මගට කිසිම අයුරකින් අවතීර්ණ නොවූ, පක්ෂයට මොනම අයුරකින් හෝ බලපෑම් නොකළ තැනැත්තියකි..', යනුවෙන් කර තිබෙන ඔහුගේ ප්‍රකාශයෙහි හෙළි නොකල කරුණු කිහිපයක් අඩංගු වී ඇත.

එනම් එම සහෝදරියගේ දෙමව්පියන් ඇතුළු පවුලේ සියළු දෙනාම ලංකා සම සමාජ පක්ෂයේ සාමාජිකයන්, ක්‍රියාකාරිකයන් හෝ ආධාර කරුවන්ව සිටි බව, පසුව ඔවුන් සියළු දෙනාම ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රබල සාමාජිකයන් සහ ක්‍රියාකාරිකයන් බවට පත් වූ බව, සහ ලංකා ගුරු සංගමයේ සභාපතිවරයාව සිටි ශ්‍රීමතී සහෝදරියගේ වැඩිමහල් සොහොයුරු වූ, නැසී ගිය එච්.එන් ප්‍රනාන්දු සහෝදරයා ඇතුළු පවුලේ සහෝදරවරු සියළු දෙනාම ජවිපෙ දේශපාලන ක්‍රියාකාරිකයන් වී සිටි බව යනාදිය ඉන් සමහරකි.

ශ්‍රීමතී සහෝදරිය ඇතුළු මේ සියළු දෙනා උපතින් ක්‍රිස්තියානි ලබ්ධිකයෝ වූහ. පක්ෂයේ සියළු සාමාජිකයින්ට ආදර්ශයක් වන ආකාරයට රෝහණ සහෝදරයා සහ ශ්‍රීමතී සහෝදරිය අතර විවාහය ඉතා චාම් ආකාරයෙන් පැවැත්වීම සුදුසු බවයි ජවිපෙ නායකයින් සියළු දෙනාම පාහේ කියා සිටියේ. ශ්‍රීමතී සහෝදරියගේ පවුලේ තිබුණු දේශපාලන පසුබිම අනුව එසේ කටයුතු කළ හැකි බවත්, ඒ සඳහා ඔවුන්ට මැදිහත් විය හැකි බවත් අනෙක් නායකයෝ කියා සිටියහ. එහෙත් ඒ පිළිබඳව සම්පූර්ණ එකඟතාවක් ඔවුන් අතර ඇති කර ගත හැකි වූයේ නැත.



විජේවීර පවුලේ උදවිය

ශ්‍රීමතී සහෝදරිය විවාහයෙන් පසු ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන සාකච්ඡා වලට සහභාගි වූ බවත්, රෝහණ සහෝදරයා සමග දේශපාලන සාකච්ඡා වලට සහභාගි වීමට මොරටුවේ රාවතාවත්තේ ඔවුන්ගේ නිවසට ආ ගිය සියළු දෙනාට සහෝදරත්වයෙන් යුතුව හැකි ආකාරයෙන් සත්කාර කල බවත්, ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලනයට පක්ෂපාතී ලෙස කටයුතු කල බවත්, රෝහණ සහෝදරයා ජීවත්ව සිටියදීත්, ඔහු ඝාතනයට පත් කරන ලද පසුවත් තම දූ දරුවන් මුළු ධෛර්යය යොදා රැක බලා ගනිමින් කටයුතු කල බවත් මම දනිමි. එහෙයින් 'එම සොහොයුරිය ජවිපෙ නායකයාගේ බිරිඳ මිස, ජනතා විමුක්ති පෙරමුණේ ගමන් මගට කිසිම අයුරකින් අවතීර්ණ නොවූ, පක්ෂයට මොනම අයුරකින් හෝ බලපෑම් නොකළ තැනැත්තියකි..' යන ප්‍රකාශය සපුරාම සාවද්‍ය වූවකි.

රෝහණ සහෝදරයා ළඟින්ම ඇසුරු කළ කෙනෙක් හැටියට මම, මෙම විවාහයෙන් පසු එම පවුලේ ඇති වූ ඛේද ජනක තත්වය ද දැන සිටියෙමි. 1980 ජූලි වැඩ වර්ජනයේ පසුබිම තුල මෙම ඛේද ජනක තත්වය වඩා හොඳින් අවබෝධ කර ගත හැකිය. ජනතා විමුක්ති පෙරමුණ මෙම වැඩ වර්ජනය කෙරෙහි දැක්වූයේ නම්‍යශීලී ආකල්පයකි. එම ආකල්පයට හේතු වූයේ, එක අතකින් රටේ වැඩ කරන ජනතාව අතර ඇතිව තිබුණ ආර්ථික ප්‍රශ්නත්, එම තත්ත්වයට එරෙහිව විරෝධය දැක්වීමට ලංකා ගුරු සංගමයද ඇතුළුව ඇතැම් වෘත්තීය සමිති විසින් තීරණය කොට තිබීමත්, ඒ වන විට නැගී එමින් තිබුණු ජනතා විමුක්ති පෙරමුණේ වෘත්තීය සමිති වැඩ කටයුතු අඩාල කර දැමීම සඳහා එක්සත් ජාතික පක්ෂ රජයටත්, පැරණි වමේ ව්‍යාපාරයටත්, ඒ හා සම්බන්ධ වෘත්තීය සමිති වලටත් අවශ්‍ය වී තිබීමත්, මේ සියල්ලටම වඩා මහා වැඩ වර්ජනයක් කරන්නට තරම් විෂය මූලික හෝ මනෝ මූලික තත්ත්වයක් රටේ පැන නැගී නොතිබීමත් යන කරුණු ය.

1977 දී බලයට පැමිණි එක්සත් ජාතික පක්ෂ රජය, 1978 දී විවෘත ආර්ථිකය හඳුන්වා දීමෙන් ද, විධායක ජනාධිපති ක්‍රමය ඇති කිරීමෙන් ද, 1979 දී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සම්මත කර ගැනීමෙන් ද, වෙන කවරදාකවත් නොවූ පරිද්දෙන් රජය අතට බලය කේන්ද්‍ර ගත කොට ගෙන තිබුණි. නිදහස් වෙළෙඳ ආර්ථිකය දකුණේ වැඩ කරන ජන කොටස් අතර ජනප්‍රිය වූවක් නොවීය.

එහෙත්, නැසී ගිය ජේ.ආර්.ජයවර්ධන මහතා විධායක ජනාධිපතිවරයා වශයෙන් බලයට පත් වීමෙන් පසුව, වැඩ වර්ජනය කරන සියළුම දෙනාට අමතක නොවන ආකාරයේ පාඩමක් උගන්වන්නට පියවර ගත්තේය. මේ වාතාවරණය යටතේ, ජවිපෙ යෝජනා කර සිටියේ එක් වරම මහා වැඩ වර්ජනයකට යන්නේ නැතිව, මුලින් එක් එක් ආයතන වල මතු වී තිබුණු ප්‍රශ්න මත පදනම් වෙමින්, එම ආයතන තුළ සිටින වැඩ කරන ජන කොටස් බහුතරයක සහභාගිත්වයෙන් යුතුව මෙම වැඩ වර්ජනය රැල්ලක් ලෙස දියත් කළ යුතු බවයි. එහෙත් මෙම අදහස ප්‍රතික්ෂේප කළ එම වෘත්තීය සමිති විසින් ඔවුන් බලා පොරොත්තුවූ පරිදි මහා වැඩ වර්ජනය දියත් කරන ලදී.

රජය විසින් එහි මුළු වෙර යොදා වැඩ වර්ජනය මර්දනය කරනු ලැබිණි. එම වැඩ වර්ජනයට සහභාගී වුණු 60,000කට අධික සංඛ්‍යාවක් වහාම රැකියාවෙන් නෙරපා දමන ලද අතර, ඇතැම් තැන් වල වැඩ වර්ජනයේ යෙදුණු අයට එරෙහිව අමානුෂික ලෙස බරපතල ප්‍රචණ්ඩ ක්‍රියා එල්ල කරන ලදී. ඔවුන්ගෙන් ඇතැමෙක් පසු කාලයේදී දිවි ගැට ගසා ගැනීමට ක්‍රමයක් සොයා ගත නොහැකිව සියදිවි හානි කර ගත්හ. ආයතන වල පැන නැගුණ ආරවුල් නිරාකරණය කර ගැනීමේදී වෘත්තීය සමිති ව්‍යාපාරය මුළුමනින්ම බැහැර කර දැමීමත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් පනවන ලද නව ලිබරල්වාදී විවෘත ආර්ථික ප්‍රතිපත්ති දැඩි ලෙස ක්‍රියාවේ යෙදීමත්, රජය බලාපෙරොත්තු වූ ආකාරයට ඉටු කරගන්නා ලදී.

මෙවැනි කණගාටුදායක වාතාවරණයක් තුළ තමාගේ මස්සිනා ව සිටි, නැසී ගිය එච්.එන්.ප්‍රනාන්දු සහෝදරයාත්, ඔහු සභාපති ධූරය හෙබ වූ ලංකා ගුරු සංගමයත් රෝහණ සහෝදරයාගේ ප්‍රධාන ප්‍රහාරාත්මක ඉලක්කයන් බවට පත් වූහ. එපමණක් නොව, ඔහු මේ සම්බන්ධයෙන් සිය පවුල තුළද දැඩි ලෙස හිතුවක්කාර සහගත වූත්, ආධිපත්‍යවාදී වූත් අත්තනෝමතික වූත් පාලනයක් ආරම්භ කලේය. ශ්‍රීමතී සහෝදරියටත්, ඇය-ගේ මව ඇතුළු පවුලේ අනෙක් සියළු දෙනාටත් එච්.එන්.ප්‍රනාන්දු සහෝදරයා සමග හෝ ඔහුගේ බිරිඳ සමග හෝ මොනයම් ආකාරයකවත් සම්බන්ධකමක් පවත්වා ගැනීම මුළුමණින්ම වාරණය වූයේද මෙම වාතාවරණය තුළය.

රජයේ බලය ඒකාධිපති ආකාරයකට විධායක ජනාධිපති වූ තමන් වටා ගොනු කර ගැනීමට ජේ.ආර්.ජයවර්ධන මහතා ක්‍රියාකල අයුරින්ම, පවුල තුළ විධායක බලය තමන් අත ගොනු කර ගැනීමට රෝහණ සහෝදරයා පියවර ගත්තේය. සමාජවාදී දේශපාලන අවබෝධයක් සහිත වූ පුද්ගලයෙක් මෙසේ හැසිරීම කෙසේ විස්තර කළ හැකි දැයි මා දන්නේ නැත. ඒ කෙසේ වෙතත් පවුල තුළත්, සමාජය තුළත්, රාජ්‍ය බලය තුළත්, බලය සාධාරණ ලෙස බෙදා හදා ගැනීමෙන් තොරව, අනෙක් අය වෙත ගරු කරමින් කටයුතු කිරීමෙන් තොරව සමාජවාදයක් ගැන ඇති කර ගත හැක්කේ පුහු බලාපොරොත්තුවක් පමණක් බව අමුතුවෙන් පැහැදිලි කල යුතු නැත. රෝහණ සහෝදරයාගේ අත්තනෝමතික භාවය ඔහුගේ දේශපාලනය කෙරෙහි අයහපත් ලෙස බල පෑ බවට කිසිදු සැකයක් නැත. - *(ඉදිරි කලාපයට)*

**ලයනල් බෝපගේ**

ශ්‍රීමතී සහෝදරිය විවාහයෙන් පසු ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන සාකච්ඡා වලට සහභාගි වූ බවත්, රෝහණ සහෝදරයා සමග දේශපාලන සාකච්ඡා වලට සහභාගි වීමට මොරටුවේ රාවතාවත්තේ ඔවුන්ගේ නිවසට ආ ග   ය සියළු දෙනාට සහෝදරත්වයෙන් යුතුව හැකි ආකාරයෙන් සත්කාර කල බවත්, ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලනයට පක්ෂපාතී ලෙස කටයුතු කල බවත්, රෝහණ සහෝදරයා ජීවත්ව සිටියදීත්, ඔහු ඝාතනයට පත් කරන ලද පසුවත් තම දූ දරුවන් මුළු ධෛර්යය යොදා රැක බලා ගනිමින් කටයුතු කල බවත් මම දනිමි. එහෙයින් 'එම සොහොයුරිය ජවිපෙ නායකයාගේ බිරිඳ මිස, ජනතා විමුක්ති පෙරමුණේ ගමන් මගට කිසිම අයුරකින් අවතීර්ණ නොවූ, පක්ෂයට මොනම අයුරකින් හෝ බලපෑම් නොකළ තැනැත්තියකි..' යන ප්‍රකාශය සපුරාම සාවද්‍ය වූවකි.

